**ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව - 2014**

**------------------------------------------------------**

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය හා 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ vii කොටසේ 40 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.

**----------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිති වලට ( ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම

අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 අහිතකර මතය සඳහා පදනම**

**------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණට ගැලපීම් කර තිබුණේ නම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහෝමයක් මූලිකාංග වලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

**2. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**2.1 අහිතකර මතය**

**------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණෙහි වැදගත් බව හේතුවෙන් 2014 දෙසැම්බර් 31 දිනට ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

විද්‍යා හා තාක්ෂණ ආයතන විමර්ශනය කිරීමට අදාළව විද්‍යාර්ථීන් වෙත ගෙවිය යුතුව තිබූ රු.695,000ක් සම්බන්ධ ගනුදෙනු ගිණුම්ගත කර නොතිබුණි.

## 2.3 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීතිරීති,රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනත 5(ආ) වගන්තිය | "රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ව්‍යාපාර විසින් විද්‍යා හා තාක්ෂණය භාවිතා කිරීම පිළිබඳව ඉකුත් වර්ෂයේ ශ්‍රී ලංකාව තුළ කරන ලද විද්‍යා හා තාක්ෂණ කටයුතු සමාලෝචන වාර්තාව " ඉකුත් වර්ෂය හා සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) 2011 සැප්තැම්බර් 15 දිනැති අංක 58(2) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.1 වගන්තිය | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා දීමනා ගෙවීමේදී සියයට 10ක් රඳවා ගැනීමේ බදු අඩුකළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ රඳවා ගැනීම් බදු අඩුකිරීමකින් තොරව රු.272,000ක් ගෙවීම් සිදුකර තිබුණි. |
| (ඇ) 2006 මාර්තු 01 දිනැති අංක 09 දරන ජාතික ප්‍රසම්පාදන ආයතන චක්‍රලේඛයේ 2.7.7 පරිච්ඡේදය | කලාපීය ප්‍රසම්පාදන කමිටු සාමාජික සංඛ්‍යාව තිදෙනෙකු විය යුතු අතර ඉන් එක් අයෙකු ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ දැනුම ඇති ප්‍රසම්පාදන ඒකකයෙන් පරිබාහිර පුද්ගලයෙකු විය යුතු වුවද කොමිෂන් සභාවේ ප්‍රසම්පාදන කමිටුව සඳහා ආයතනයේ නිලධාරීන් තිදෙනෙකු පත්කර තිබුණි. |

**2.4 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

**-------------------------------------------------------------**

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව කළමනාකරණ මණ්ඩල තීරණයක් මත කොමිෂන් සභාව සඳහා උපදේශකවරියකගේ සේවය ලබාගෙන තිබුණු අතර මාස 04 ක කාලයක් සඳහා ඒ වෙනුවෙන් රු.240,000 ක් ගෙවා තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**-----------------------**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

**----------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කොමිෂන් සභාවේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.153,004 ක අතිරික්තයක් පෙන්නුම් කරන අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂය සඳහා රු. 130,785 ක ඌනතාවයක් විය. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 283,789 ක වැඩි වීමක් පෙන්නුම් කළද 2.2.1 ඡේදයේ දක්වා ඇති කරුණ ගැලපීම් කර තිබුණේ නම් මෙහෙයුම් ප්‍රතිඵලය රු.541,996 ක ඌනතාවයක් වීමට තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**---------------------------**

**4.1 කාර්ය සාධනය**

**----------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව රාජ්‍ය ආයතන 04ක කටයුතු විමර්ශනය කර අදාල වාර්තා සැපයීමට සැලසුම් කර තිබූ අතර ඒ සඳහා රු.1,656,995 ක් වැයකර විමර්ශන කටයුතු සිදුකර තිබුණි. නමුත් සැලසුම් කළ පරිදි අවසාන වාර්තා යැවීමට සභාව අපොහොසත් වී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට කෙටුම්පත් වාර්තා පමණක් යවා තිබුණි.

(ආ) කොමිෂන් සභාව විසින් ලංකාව තුල පවත්නා සෑම විද්‍යා හා තාක්ෂණ ආයතනයක්ම විමර්ශනයට ලක් කිරීමට සැලසුම් කර තිබුණු අතර ඒ සඳහා රු.මිලියන 1.4 ක් ඇස්තමේන්තු කර තිබුණද සමාලෝචිත වර්ෂයේදී මීට අදාල කිසිදු කටයුත්තක් ඉටුකර නොතිබුණි.

(ඇ) විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති සම්බන්ධව වර්තමාන වැදගත්කම අධ්‍යයනය කිරීම සඳහා රු.මිලියන 1.6ක් ඇස්තමේන්තු කර තිබූ අතර කොමිෂන් සභාව පැවැත්වූ හත්වන ද්වි පාර්ශ්වික සමුළුවේ වැඩ කටයුතු සමඟ අධ්‍යයන කටයුතු ඉටුකිරීම සඳහා රු.34,541 ක් පමණක් වැයකර තිබුණි. ඒ අනුව වැයවූ පිරිවැය සියයට 2.2 ක් බැවින් සභාව අධි ඇස්තමේන්තුවක් සකසා ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඈ) සභාව විසින් රු.2,995,861 ක් වැයකර සංවිධානය කරන ලද හත්වන ද්වි පාර්ශ්වික සමුළුවේදී ක්ෂේත්‍ර 10කට අදාළව විද්‍යා හා තාක්ෂණ දියුණුවක් ඇති කිරීමට එකඟතාවයකට පැමිණ තිබුණද ක්‍රියාත්මක තත්ත්වයේ පවතිනුයේ එක් ක්ෂේත්‍රයකට අදාල වැඩසටහන් පමණි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

ජාතික විද්‍යාගාර උපකරණ මධ්‍යස්ථානය සඳහා වූ ප්‍රතිපත්තිය සම්බන්ධ කෙටුම්පත් වාර්තාව 2014 ජූනි 30 දින කොමිසම වෙත ලැබී තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අවසාන වාර්තාව සකස් කර නොතිබුණි.

## 4.3 දෘශ්‍ය අක්‍රමිකතා

2014 මැයි 02 දින සේවයට බඳවාගත් නිලධාරියෙකුට හිමි නිවාඩු ඉක්මවා ලබාදුන් පෞද්ගලික නිවාඩු දින 8 ½ ක් වැටුප් රහිත නිවාඩු ලෙස වැටුපෙන් අයකිරීම් සිදුකර නොතිබු අතර ආයතන සංග්‍රහයේ XV පරිච්ඡේදයේ 10 වගන්තිය ප්‍රකාර විදේශ ගමන් යාම සඳහා ගරු අග්‍රාමාත්‍යවරයාගේ අවසරය ලබාගෙන නොතිබුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 19 ක් වූ අතර එයින් ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ තනතුරු 02 ක්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර තනතුරක් හා කළමනාකරණ සහකාර තනතුරක් පුරප්පාඩු වී පැවතුණි.

(ආ) කොමිෂන් සභාවේ බඳවා ගැනීමේ පරිපාටියට පරිබාහිරව සමාලෝචිත වර්ෂයේදී ජ්‍යෙෂ්ඨ විද්‍යාර්ථී තනතුර සඳහා නිලධාරියෙකු බඳවාගෙන රු.480,000 ක් ගෙවා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණන ඒකකයක් විගණිත දිනය තෙක් පිහිටුවා නොතිබුණු අතර, අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මඟින් විගණන කටයුතු ආවරණය කර තිබුණි.

(ආ) 2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009(1) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 09 වන වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් කාර්තුමය අභ්‍යන්තර විගණන වාර්තා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වල සාකච්ඡා කිරීම සඳහා ඉදිරිපත් කර නොතිබුණු අතර වර්ෂය තුළදී විගණන විමසුම් කිසිවක් නිකුත් කර නොතිබුණි.

### 5.2 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයේ ඇස්තමේන්තුගත ආදායම හා වියදම, තථ්‍ය ආදායම හා වියදම සමඟ සැසඳීමේදී සියයට 10 සිට 100 දක්වා විචලනයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් උපයෝගී කරගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) අයවැය පාලනය

(ආ) සේවක මණ්ඩල කළමනාකරණය